# ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.

## VII සභා වාරය හැටවන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.
දිනය : 2023.02.14.
වේලාව : පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:
01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
14.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:
01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
07.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
08.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

නිලධාරි සහභාගීත්වය:
01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ හැටවන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන් සහ මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2023.01.10. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් 2023.01.10. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

" ඔබතුමාගේ පක්ෂ සංවිධායක දොස්තර මහතෙක් සමහර පක්ෂ සාමාජිකයන් මඟින් බූරු ගස්සනවා. ගල් ටික හොරෙන් අද්දවනවා. ඔවුන්ගේ නම් ඉදිරිපත් කළ හැකියි. විවේචනය කරලා ෆේස්බුක් එකට ඉදිරිපත් කිරිමට හැකි බව ප්‍රකාශ කිරිමත් සමඟ," යන සටහන

" ඔබතුමාගේ පක්ෂයට සම්බන්ධ සංවිධායක දොස්තර මහතෙක් විදාගම මාර්ග සංවර්ධනයට ගෙනා මැටිල් ටික අදිනවා. ඒ පිළිබඳව මා මුහුණුපොත සමාජ මාධ්‍ය ජාලයටත් ඉදිරිපත් කළා. අපේ ගමේ ජ.වි.පෙ.ප සඳහා වැඩ කරන සාමාජිකයෙක් බූරුවා ගස්සවනවා." ලෙසට සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2023.01.10. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

(i). කුමරතුඟු මහජන පුස්තකාලයීය උපදේශන කමිටුවේ 2012 වර්ෂයේ සිට අඛණ්ඩව සාමාජිකයෙක්, උපදේශවරයෙක් වශයෙනුත්, පුස්තකාලය විසින් වාර්ෂිකව එළි දක්වනු ලබන ප්‍රතිභා ප්‍රභා සඟරාවේ සංස්කාරකවරයෙක් ලෙසින් පුස්තකාලයේ වැඩිදියුණුවට හා අභිවෘද්ධියට විශාල සේවයක් සිදුකල විමල් පන්නිලවත්ත මහතා අභාවප්‍රාප්ත පත්වීම සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශ කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

(ii). පසුගිය දිනෙක නන්පේරියල් වතුයායේ කඳුකර කැළෑ ප්‍රදේශය තුල ගිනි තැබීමක් සිදු වී තබූ බැවින්, එම ගින්න පැතිරීම වළක්වාලමින් ගින්න නිවා දමා වන සංරක්ෂණයට විශාල සහයෝගයක් ලබා දීම සම්බන්ධයෙන් ගැමුණු හේවා බලකායේ, නන්පේරියල් අනුඛණ්ඩයේ අණදෙන නිලධාරිතුමා ඇතුළු නිලධාරින්ට විශේෂ ස්තූතිය ප්‍රකාශ කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර, ස්තූතිය පල කරමින් ලිපියක් යොමු කිරීමටත් කටයුතු කරමු. එමෙන්ම ඉදිරි කාලයේ දී ඉඩෝරය සහිත කාලගුණය එළඹෙන බැවින්, කැළෑගිනි තැබීමේ ක්‍රියාවන් සිදුවිය හැකිය. එබැවින් එවැනි අවස්ථාවන් මඟ හරවා ගැනීමට තම කොට්ඨාසයන්හි ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරමු.

## (03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් බෙලිහුල්ඔය, කිංචිගුණේ, ප්‍රජා ජල මූලාශ්‍රයේ ගබඩා ටැංකි ඇතුළු සියලුම සම්පත් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරා ගන්නා ලෙසත්, එහි පාලන කටයුතු නිසියාකාරයෙන් පවත්වා ගනිමින් පඹහින්න ජල ව්‍යාපෘතියෙන් ජලය ලබා නොගත් ප්‍රදේශවාසීන්ට ජලය ලබා දීමට කටයුතු කරන ලෙසට, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා මඟින් ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
එම ප්‍රජා ජල ව්‍යාපෘතිය නඩත්තු කටයුතු වලදී සේවකයන් යෙදවීම, ජල මීටර් සවි කිරීම, ජල ධාරිතාවය සලකා බැලීම, විදුලි බිල් පියවීම, සභාවට පවරා ගැනීමේ අරමුණු පිළිබඳව, සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සැහීමකට පත්වීම යනාදී කරුණු සම්බන්ධයෙන් හා කාර්මික නිලධාරි මහතාගේ සමීක්ෂණ ක්‍රියාවලියකින් අනතුරුව, නිත්‍යානුකූල තත්ත්වය සලකා බලා සමිතිය සමඟ කොන්දේසි සහිතව ගිවිසුම් ගත වී සභාවට පවරා ගැනීමට කටයුතු කරමු.

සභාවට පවරා ගැනීමේ දී එම ප්‍රජා ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කාර්මික නිලධාරි මහතාගේ සමීක්ෂණ ක්‍රියාවලියෙන් අනතුරුව, ලබා දෙනු ලබන වාර්තාව සලකා බලා කිංවිගුණේ, බෙලිහුල්ඔය, ප්‍රජා ජල මූලාශ්‍රයේ ගබඩා ටැංකි ඇතුළු සියලුම සම්පත් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සුදුසු බවට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව, සභාවට පවරා ගැනීමේ දී එම ප්‍රජා ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කාර්මික නිලධාරි මහතාගේ සමීක්ෂණ ක්‍රියාවලියෙන් අනතුරුව, ලබා දෙනු ලබන වාර්තාව සලකා බලා කිංවිගුණේ, බෙලිහුල්ඔය, ප්‍රජා ජල මූලාශ්‍රයේ ගබඩා ටැංකි ඇතුළු සියලුම සම්පත් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.
කිසිවක් ඉදිරිපත් වී නැත.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.
(i). ප්‍රාදේශීය සභා සඳහා වන මූල්‍ය හා පරිපාලන රීතිවලට අනුකූල වන පරිදි ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය විධිමත්ව 2023 වර්ෂයේ ජනවාරි 31 දිනෙන් අවසන් කිරිමට පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් දෙන ලද උපදෙස් අනුව, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු විධිමත්ව සිදු කිරීමෙන් අනතුරුව, ඉදිරිපත් කරන ලද වාර්තාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

2022 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව සභා සම්මත කිරිම සුදුසු බවට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, 2022 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීමේ සහ අපහරණය කිරීමේ කමිටුව ලෙසට, එම්. ලක්ෂිත තරිඳු මයා, එම්.එන්.පී. මුණසිංහ මයා, චාමර අනුරද්ධ මයා, යූ.එම්. ජයතිලක මයා, තක්ෂිලා කුමුදුමාලි මිය යන නිලධාරින්ගෙන් හා නිලධාරිනියන්ගෙන් යුක්ත කමිටුවක් පත් කරවා ගැනීමටත්, එම ක්‍රියාවලිය සඳහා 2023/03/15 වන දිනය යොදා ගැනීමටත් අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීමේ සහ අපහරණ කමිටුව සඳහා නම් කරන ලද නිලධාරින් පත් කිරීම හා එම කටයුතු සඳහා 2023/03/15 වන දින යොදා ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීමේ සහ අපහරණය කිරීමේ කමිටුව සඳහා එම්. ලක්ෂිත තරිඳු මයා, එම්.එන්.පී. මුණසිංහ මයා, චාමර අනුරද්ධ මයා, යූ.එම්. ජයතිලක මයා, තක්ෂිලා කුමුදුමාලි මිය යන නිලධාරින්ගෙන් හා නිලධාරිනියන්ගෙන් යුක්ත කමිටුවක් පත් කිරීම හා එම කටයුතු සඳහා 2023/03/15 වන දිනය යොදා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(iii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ කටයුතු කරගෙන යාමේ දී නීති උපදෙස් ලබා ගැනීම හා අධිකරණයේ නඩු කටයුතු වලට සභාව වෙනුවෙන් පෙනී සිටීම, නීති කටයුතු පවත්වාගෙන යාම සඳහා නීතිඥ මහත්මාවරුන් පත් කරවා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් නීතිඥ වරුණ දිසානායක මහතා සහ නීතිඥ දේශබන්දු සූරියපට බැඳි යන නීතිඥ මහත්මාවරුන් පත් කරවා ගැනීමටත් ඒ බව ඔවුන් වෙත දන්වා යැවීමටත් සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, නීති උපදෙස් ලබා ගැනීම හා අධිකරණයේ නඩු කටයුතු වලට සභාව වෙනුවෙන් පෙනී සිටීම, නීති කටයුතු පවත්වාගෙන යාම සඳහා නීතිඥ වරුණ දිසානායක මහතා සහ නීතිඥ දේශබන්දු සූරියපටබැඳි යන නීතිඥ මහතුන් පත් කරවා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(iv). වර්තමාන වෙළඳපලේ කඩදාසි, ඒ ආශ්‍රිත අමුද්‍රව්‍ය වල ඉහළ යාම හා මාසික විදුලි බිල අනෙකුත් මාසයන්ට සාපේක්ෂව ඉහළ යාම නිසා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ නැණසල පරිගණක පුහුණු මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන්හි දැනට අය කරනු ලබන ගාස්තු සංශෝධනය කරවා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට අනුබද්ධ බලංගොඩ ණැනසල මධ්‍යස්ථානය මඟින් අය කරනු ලබන ගාස්තු සැලකිල්ලට ගනිමින් අප ආයතනයට සරිලන මිල ගණන් ඉදිරිපත් කර ඇති බවත්, ණැනසල පරිගණක පුහුණු මධ්‍යස්ථානය විසින් සපයනු ලබන ඡායා පිටපත් හා අනෙකුත් සේවාවන්හි සංශෝධනය කරගතයුතු ගාස්තු සඳහන් කරමින්, මෙම යෝජිත මිළ ගණන් සම්බන්ධයෙන් සෑහීමකට පත්වන්නේ නම් එම ගාස්තු සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත්, තවදුරටත් මෙම යෝජිත මිළ ගණන්වල වෙනසක් විය යුතු නම් ඒ පිළිබඳව ද සැලකිල්ල යොමු කර, අයකළ යුතු ගාස්තු සඳහා යෝජනා හා අදහස් ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරමින් ඊට අදාල වූ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | සේවා වර්ගය | ප්‍රමාණය / කාල වකවානුව | දැනට අය කරනු ලබන මිල ගණන් | සංශෝධිත මිල ගණන් |
|---|---|---|---|---|
| 01 | ඡායා පිටපත් මුද්‍රණය | | | |
| | A 4 තනිපැත්ත | පිටපත් 1 | රු.3.00 | රු.5.00 |
| | A 4 දෙපැත්ත | පිටපත් 1 | රු.4.00 | රු.6.00 |
| | A3 තනිපැත්ත | පිටපත් 1 | රු.8.00 | රු.10.00 |
| | A3 දෙපැත්ත | පිටපත් 1 | රු.10.00 | රු.15.00 |
| | ස්කෑනර් - A 4 | පිටපත් 1 | රු.10.00 | රු.15.00 |
| | ෆැක්ස් - A 4 | පිටපත් 1 | රු.20.00 | රු.25.00 |
| 02. | අන්තර්ජාල සේවා | පැයකට | රු.40.00 | රු.50.00 |
| 03 | Type Setting | පිටපත් 1 | රු.40.00 | රු. 50.00 |
| 04 | Print Out | | | |
| | Normal | පිටපත් 1 | රු.20.00 | රු.30.00 |
| | Colour | පිටපත් 1 | රු.20.00 | රු.50.00 |
| 05. | පර්ගණක සහතික පත්‍ර පාඨමාලාව | ත්‍රෛමාසික | | රු.6000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 06. | දෙමළ භාෂා පාඨමාලාව<br>(2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා<br>6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා) | මසකට | රු.400.00 | රු.500.00 |

සභාවේ නැණසල පරිගණක මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන්හි දැනට අය කරනු ලබන ගාස්තු වෙනුවට ඉදිරිපත් කර ඇති මිළ ගණන් අනුව එම ගාස්තු සංශෝධනය කිරීම සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව සභාවේ නැණසල පරිගණක මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන්හි දැනට අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(v). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා පෙර පාසල් පාලිකාවන් දෙදෙනාට, හිටුවල මුදිත පෙර පාසල් පාලිකාවට, ඥානසල පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ උපදේසිකාවට දැනට ගෙවනු ලබන රු. 7500/- ක දීමනාව, රු. 12000/- ලෙස වැඩි කර ගෙවීම සඳහා 2022/09/01 දින පැවැති අයවැය කෙටුම්පත් සාකච්ඡාවේ දී සාකච්ඡාකර අයවැය ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින්, එම දිමනා 2023 වර්ෂයේ සිට ගෙවිම් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

පෙර පාසල් පාලිකාවන් තිදෙනාට සහ ඥානසල පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ උපදේසිකාවට දැනට ගෙවනු ලබන රු. 7500/- දීමනාව රු. 12000/- ක් ලෙස වැඩි කර ගෙවීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, පෙර පාසල් පාලිකාවන් තිදෙනාට සහ ඥානසල පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ උපදේසිකාවට දැනට ගෙවනු ලබන රු. 7500/- දීමනාව රු. 12000/- ක් ලෙස වැඩි කර ගෙවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vi). රත්නපුර තාක්ෂණ විද්‍යාලයේ පැවැත්වෙන විදුලි කාර්මික ශිල්පී NVQ4 පාඨමාලාව හදාරන බවත්, එම පාඨමාලාවේ ප්‍රායෝගික අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරිම සඳහා සය මාසික ප්‍රායෝගික පුහුණුවක් අවශ්‍ය බවට සුදු හකුරු කන්ද, පහළ වලේබොඩ, ලිපිනයෙහි පදිංචි ඊ.එස්.එන්.ඩබ්. ඉලේසිංහ යන අය විසින් ඉල්ලීමක් කර ඇති බැවින්, අප ආයතනයේ විදුලි කාර්මික සය මාසික පුහුණුවක් ලබා දීමටත්, 4/2017 චක්‍රලේඛය ප්‍රකාරව පුහුණුලාභියෙකු සඳහා දෛනිකව ගෙවනු ලබන රු. 500 ක දීමනාව ගෙවීමටත් අදාලව ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

දීමනා සහිතව ඊ.එස්.එන්.ඩබ්. ඉලේසිංහ යන අයට සය මාසික පුහුණුවක් ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, දීමනා සහිතව ඊ.එස්.එන්.ඩබ්. ඉලේසිංහ යන අයට සය මාසික පුහුණුවක් ලබා දිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vii). මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළාත් පාලන ආයතන සඳහා සභිකයන් තෝරා පත් කරවා ගැනීමට මැතිවරණයක් පැවැත්වීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බැවින්, 2023 වර්ෂයේ පෙබරවාරි මස සිට ඉන් ඉදිරියට මන්ත්‍රී දීමනාව ගෙවීම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් පවතින බැවින්, එම දීමනා ගෙවීම

පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමාගේ වාචික උපදෙස් පරිදි හා මහ සභාවේ එකඟතාවය පරිදි, 2023 වර්ෂයේ පෙබරවාරි මස සිට ඉන් ඉදිරියට මන්ත්‍රී දීමනාව, ඉන්ධන දිමනාව, දුරකතන දිමනාව ගෙවීමටත්, එම දීමනා ගෙවීමෙන් අනතුරුව, ලිත් මසකට පෙර සභාව විසුරුවා හැරිය හොත් එම විසුරුවා හරින දිනෙන් පසු කාලය සඳහා වන දිමනා දින 14 ක් ඇතුළත සභාව වෙත ආපසු ගෙවීමේ පොරොන්දුව මත ගෙවීම සඳහා උපදෙස් පතමින් ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

2023 වර්ෂයේ පෙබරවාරි මස සිට ඉන් ඉදිරියට සම්පූර්ණ මන්ත්‍රී දීමනාව, ඉන්ධන දිමනාව, දුරකතන දිමනාව ගෙවීම සුදුසු බවත්, ගෙවීමෙන් පසු පළාත් පාලන ආයතන විසුරුවා හැරියහොත්, එම විසුරුවා හරින දිනෙන් පසු කාලය සඳහා ගෙවන ලද දීමනා දින 14 ක් ඇතුළත සභාව වෙත ආපසු ගෙවීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂයේ පෙබරවාරි මස සිට ඉන් ඉදිරියට සම්පූර්ණ මන්ත්‍රී දීමනාව, ඉන්ධන දිමනාව, දුරකතන දිමනාව ගෙවීම සුදුසු බවත්, ගෙවීමෙන් පසු පළාත් පාලන ආයතන විසුරුවා හැරියහොත්, එම විසුරුවා හරින දිනෙන් පසු කාලය සඳහා ගෙවන ලද දීමනා දින 14 ක් ඇතුළත සභාව වෙත ආපසු ගෙවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(viii). ගිණුම් ක්‍රම ප්‍රමිත වලට අදාලව හා ප්‍රාදේශීය සභා සඳහා වන මූල්‍ය පරිපාලන රීතිවලට අනුකූල වන පරිදි 2022 වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරිමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

2022 වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනය සභා සම්මත කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා සුදුසු බව විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී,එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව, 2022 වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනය සභා සම්මත කිරිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

## (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද ජනවාරි මස 01 වන දින සිට ජනවාරි මස 25 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 50 සහ වවුචර් අංක 1 - 50 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන, මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

2023.02.13. දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,

01. ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර හා ලදුපත් පොත් මිලදී ගැනීම වෙනුවෙන් මිළ මිල ගණන් කැඳවීම.
02. ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘති නඩත්තු කටයුතු සඳහා ජල උපකරණ මිලදී වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
03. ප්‍රධාන කාර්යාලය සඳහා එදිනෙදා පාවිච්චි කරන ද්‍රව්‍ය හා ටෝනර් වර්ග මිලදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.
04. බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කටයුතු සඳහා වීථි පහන් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
05. ප්‍රාදේශීය සභාවේ PF – 7461 කැබ් රථය හා RB – 6252 ට්‍රැක්ටර් රථය සඳහා වාහන ටයර් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
06. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ JCB යන්ත්‍රය සඳහා JCB ටයර් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
07. ගලගම සංචාරක ගිමන්හල වසර 05 ක් සඳහා බඳුදීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභා අනුමැතිය සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

2023 වර්ෂයේ ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

(i). නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.
අසනීප වී ඇති බැවින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී,මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව, දුරකතනයෙන් මා වෙත දැනුම් දුන් බැවින් එතුමන්ලාගේ සහ එතුමියගේ නිවාඩු අනුමත කිරිමට යෝජනා කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී,මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා යන මන්ත්‍රීවරුන්ගේ සහ මන්ත්‍රීවරියගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

අසනීප වී ඇති බැවින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව, දුරකතනයෙන් මා වෙත දැනුම් දුන් බැවින් එතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිමට යෝජනා කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා යන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

අසනීප වී ඇති බැවින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,දෙවටගේ ධර්මදාස මැතිතුමා අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව දුරකතනයෙන් මා වෙත දැනුම් දුන් බැවින්, එතුමාගේ නිවාඩු අනුමත කිරීමට යෝජනා කරන බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,දෙවටගේ ධර්මදාස මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.

2023 වර්ෂයේ මාර්තු මස 14 වෙනි අඟහරුවාදා දින ඊළඟ සභා වාරය පැවැත්වීමට කටයුතු කරනවා.

## (10). ස්තුති කතාව හා අවසානය.

හත්වන සභාවේ හැටවන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

ඉන් අනතුරුව, පෙ.ව. 10.27 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.